# <u>තනතුරු පුරප්පාඩු</u>
# <u>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය</u>

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පහත සඳහන් තනතුරුවල  පවතින පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. අධ්‍යක්ෂ(මානව සම්පත් හා පරිපාලන) – HM-1-1 - තනතුරු 01

### අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :

#### (1) අධ්‍යාපන සුදුසුකම් :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ව්‍යාපාර කළමනාකරණය හෝ කළමනාකරණය, වාණිජ්‍ය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සමග**

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ( Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොව (15)ක පළපුරුද්දක් ලබා තිබීම.

### ආ. **අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම  - සුදුසුකම්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සේවා ගණයේ  පළමුවන ශ්‍රේණියේ තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

### ඇ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ආයතනයේ පුද්ගල හා පාලන කටයුතු
ii. කාර්යාල පද්ධතිය දියුණු කිරීම හා නඩත්තු කිරීම
iii. මානව සම්පත් සංවර්ධනය, බඳවා ගැනීම් , පුද්ගල කළමනාකරණය හා උපායමාර්ගික හා ප්‍රතිපත්ති සැකසීම
iv. ප්‍රවාහන කටයුතු සංවිධානය කිරීම
v. ආයතනය හා සම්බන්ධ වන නීති කටයුතුවලට අදාළ රාජකාරී ඉටු කිරීම, අවශ්‍ය අවස්ථාවලදී ආයතනය වෙනුවෙන් උසාවියේ/කම්කරු උසාවියේ පෙනී සිටීම.

ඇ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ට අනුව සිදු කෙරේ.

HM 1-1 - 2025- රු.140,640 -15 x 4,100 – 202,140.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඉ. **වයස :**

අවුරුදු 35 ට නොඅඩු අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 02. සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) – MM 1-1 - තනතුරු 05

අ. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් පිළිගත් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම (විද්‍යා හෝ කළා හෝ වාණිජ හෝ)

සහ

ඉහත අධ්‍යාපන සුදුසුකම් ලැබීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

ආ. **අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සුදුසුකම් :**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ I ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම.

ඇ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ආපදා පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමෙ කටයුතු සඳහා සහය ලබා දීම
ii. ආපදා අනතුරු ඇඟවීම් / පණිවිඩය මහජනතාවට ඉතා ඉක්මනින් ලබා දීමට අවශ්‍ය යාන්ත්‍රණය සැකසීමට සහය ලබා දීම
iii. දිස්ත්‍රික්කය තුළ ආපදා ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය මානව සම්පත්, රාජ්‍ය නොවන සංවිධාන ඇතුළත්ව උපකරණ හා යන්ත්‍ර සූත්‍ර වැඩමුළු විස්තර පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම
iv. දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි ,ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි ආපදා ප්‍රතිචාර දැකිවීම සඳහා පෙර සූදානම් සැළසුම් සකස් කිරීමට සහය ලබා දීම හා ආපදා අවස්ථාවලදී එම කටයුතු සම්බන්ධීකරණය කිරීම
v. දිස්ත්‍රික්කයේ සියළුම ආපදා පිළිබඳව තොරතුරු එක් රැස් කිරීම හා ඒවා අදාළ ස්ථාන වලට ලබා දීම
vi. දිස්ත්‍රික්කය තුළ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් ලේකම්ට අවශ්‍ය සහය ලබා දීම

ඈ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ට අනුව සිදු කෙරේ.

MM 1-1 - 2025- රු.91,690-10x2480-15x3450- 168,240.00. ජීවන වියදම් දීමනාව, වෘත්තීය දීමනාව, දුරකථන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

**ඉ. වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 03. සහකාර අධ්‍යක්ෂ (හදිසි මෙහෙයුම්) – MM 1-1 - තනතුරු 01

**අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**(1) අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් පිළිගත් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම (විද්‍යා හෝ කළා හෝ වාණිජ හෝ)

සහ

ඉහත අධ්‍යාපන සුදුසුකම් ලැබීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**ආ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ I ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම.

**ඇ. තනතුරට පැවරෙන කාර්යයන් :**

i. පශ්චාත් ආපදා සහන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම
ii. හදිසි සහන සඳහා තොග නඩත්තු / ප්‍රතිචාර දැක්වීම හා බෙදා හැරීම
iii. පසු ආපදා ප්‍රතිචාර දැක්වීම හා සහන ක්‍රියාවලිය අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණය කිරීම
iv. මිනිසා විසින් ඇති කරනු ලබන ආපදා (උදා:- රසායනික, විකිරණශීලි වැනි) සඳහා ප්‍රථම ප්‍රතිචාර දක්වන්නන් පුහුණු කිරීම හා පුහුණු කණ්ඩායම් යෙදවීමට වග බලා ගැනීම
v. සෙවීම් හා ගලවා ගැනීමේ කණ්ඩායම් සම්බන්ධීකරණය කරමින් එම කණ්ඩායම් අවශ්‍ය විට යෙදවීමට වග බලා ගැනීම
vi. පොලීසිය, හමුදා , අමාත්‍යාංශය, රාජ්‍ය නොවන ආයතන හා අනෙකුත් ආයතන සමග හදිසි සහන වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම හා පශ්චාත් ආපදා ක්‍රියාවන් සම්බන්ධීකරණය කිරීම
vii. ශ්‍රී ලංකා ආපදා සම්පත් ජාලය යාවත්කාලීන කිරීම

**ඈ. වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 ට අනුව සිදු කෙරේ.

MM 1-1 - 2025- රු.91,690-10x2480-15x3450- 168,240.00. ජීවන වියදම් දීමනාව, වෘත්තීය දීමනාව, දුරකථන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

**ඉ. වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 04. මූල්‍ය නිලධාරී - JM 1-1 - තනතුරු 01

**අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණ / ව්‍යාපාර පරිපාලන / කළමනාකරණ හෝ වාණිජ උපාධියක් ලබා තිබීම.

හෝ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම

**ආ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම,

හෝ

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ (MA 1-1) II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහකට (05) නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඇ. තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියළුම මූල්‍ය හා අභ්‍යන්තර මූල්‍ය පාලන ක්‍රම පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඉහළ කළමනාකාරිත්වයට සහය වීම.
ii. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ගිණුම් අංශයෙහි සාමාන්‍ය අධීක්ෂණය හා පරිපාලනය.
iii. මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම පොත්පත් පවත්වාගෙන යාම සහ වියදම් පාලනයට අදාළ කටයුතු තොග පාලනය සහ වත්කම් ආරක්ෂාව සම්බන්ධ කටයුතු

**ඈ. වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 ට අනුව සිදු කෙරේ.

JM 1-1 - 2025- රු.72,650-10x1360-18x2040- 122,970.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

**ඉ. වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 05. ජාල පද්ධති පරිපාලක - JM 1-1 - තනතුරු 01

**අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක ජාලකරණය පිළිබඳ හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම,

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි (NVQ ) හත් (07) වැනි මට්ටමට නොඅඩු මට්ටමක පරිගණක ජාලකරණය පිළිබඳ ප්‍රවිණතා සහතිකයක් ලබා තිබීම,

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි ((NVQ ) හය (06) වැනි මට්ටමට නොඅඩු මට්ටමක පරිගණක ජාලකරණය පිළිබඳ ප්‍රවිණතා සහතික ලබා තිබීම සහ එම සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර පහ (05)ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම,

**හෝ**

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි ((NVQ ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක පරිගණක ජාලකරණය පිළිබඳ ප්‍රවිණතා සහතික ලබා තිබීම සහ එම සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර දහය (10)ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම.

**ආ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම,

හෝ

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ (MA 2-1) II වන ශ්‍රේණියේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ වසර 05කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

**ඇ. තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි කටයුතු සඳහා අවශ්‍ය ජාලකරණ පද්ධතීන් පවත්වාගෙන යාම, නඩත්තු කටයුතු සිදුකිරීම සහ යාවත්කාලීන කිරීම.
ii. පැය 24 පුරා ක්‍රියාත්මක වන හදිසි මෙහෙයුම් මැදිරියට අවශ්‍ය ජාලකරණ පහසුකම් සැපයීම.
පැය 24 පුරා ක්‍රියාත්මක වන ජාතික හදිසි ඇමතුම් මැදිරියට (117) අවශ්‍ය වන ජාලකරණ පහසුකම් සැපයීම සහ නඩත්තුව.
iii. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි සියළු තොරතුරු ගබඩා කිරීමට අවශ්‍ය දත්ත ගබඩා පද්ධති නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම.

iv. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි සහ දිස්ත්‍රික් ඒකකයන්හී අන්තර්ජාල පහසුකම් අඛණ්ඩව පවත්වාගෙන යාම.
v. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ජාලකරණ මැදිරියේ ස්ථාපනය කර ඇති සියළුම සර්වර් පද්ධති අඛණ්ඩව පවත්වාගෙන යාම සහ ඒවා ස්ථාවර කිරීම.
vi. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ දිස්ත්‍රික් ඒකකයන් අතර ජාල පද්ධතියක් ස්ථාපිත කර පවත්වාගෙන යාම , නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම

**ඈ. වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 ට අනුව සිදු කෙරේ.

JM 1-1 - 2025- රු.72,650-10x1360-18x2040- 122,970.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

**ඉ. වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 06. තොරතුරු තාක්ෂණ නිලධාරී - JM 1-1 - තනතුරු 01

**අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ විෂය පිළිබඳ උපාධියක් ලබා තිබීම,

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවන්හි (NVQ ) හත් (07) වැනි මට්ටමට නොඅඩු මට්ටමක තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම,

හෝ

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි ((NVQ ) හය (06) වැනි මට්ටමට නොඅඩු මට්ටමක තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතා සහතික ලබා තිබීම සහ එම සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර පහ (05)ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම,

**හෝ**

තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි ((NVQ ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ එම සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර දහය (10)ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම.

**ආ. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම,

හෝ

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ (MA 2-1) II වන ශ්‍රේණියේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ වසර 05කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

ඈ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි සහ දිස්ත්‍රික් ඒකකයන්හි දෛනික තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවයන් සපුරාලීම සහ ඒවායෙහි නඩත්තු කටයුතු සිදු කිරීම ,නිසි අයුරින් පවත්වාගෙන යාම.
ii. පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු 77 හි ක්‍රියාකාරිත්වය සහ එයට අදාළ සන්නිවේදන පහසුකම් අඛණ්ඩව සැපයීම නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම .
iii. චන්ද්‍රිකා තාක්ෂණ සන්නිවේදන පද්ධතියට අවශ්‍ය සන්නිවේදන පහසුකම් සැපයීම.
iv. පැය 24 පුරා ක්‍රියාත්මක වන ජාතික හදිසි ඇමතුම් මැදිරියට (117) අවශ්‍ය වන සියලුම මෘදුකාංග සහ දෘඩාංග පද්ධතීන් සඳහා වන තොරතුරු සන්නිවේදන හා ජාලකරණ පහසුකම් සැපයීම.
vii. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි සහ දිස්ත්‍රික් ඒකකයන්හි සියලුම සේවකයන්ට අවශ්‍ය දෛනික තොරතුරු තාක්‍ෂණික අවශ්‍යතා සැපයීම හා ඒවයන්හි නඩත්තු කටයුතු සිදුකිරීම හා නිසි අයුරින් පවත්වගෙන යාම.
viii. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි පවතින තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියට අනුව කටයුතු සිදුකිරීම.
ix. ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ ජාලය (DEWN) කෙටිපණිවිඩ ක්‍රමවේදය සඳහා අවශ්‍ය සන්නිවේද හා තාක්ෂණ පහසුකම් සැපයීම නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම.
x. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි සහ දිස්ත්‍රික් ඒකකයන් හී පවතින ගුවන්විදුලි ජාලයන්හී ක්‍රියාකාරිත්වය, නඩත්තු කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
xi. හදිසි මෙහෙයුම් මැදිරියේ අවශ්‍යතාවය පරිදි භූ තොරතුරු සිතියම් නිර්මාණය කිරීම පිළිබද කටයුතු සිදුකිරීම සහ එම සිතියම් විශ්ලේෂණයට අදාල තාක්ෂණික සහාය ලබා දීම.
xii. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි පවතින වෙබ් අඩවිය සහ මෘදුකාංග පද්ධතීන් පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

ඈ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 ට අනුව සිදු කෙරේ.

JM 1-1 - 2025- රු.72,650-10x1360-18x2040- 122,970.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඉ. **වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 07. භාෂා පරිවර්තක (සිංහල - දෙමළ) - MA 3 - තනතුරු 01

අ. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිංහල හා දෙමළ විෂයන් සහිතව ලබාගත් උපාධියක්

හෝ

වෙනත් ඕනෑම ක්ෂේත්‍රයකින් ලබා ගත් උපාධියක් සමඟ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේදී සිංහල හා දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථය ලබා තිබීම.

ආ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අවශ්‍යතාවයන්ට අනුකූලව සිංහල හා දෙමළ භාෂා පරිවර්තක කටයුතු
ii. අවශ්‍ය අවස්ථාවන්හිදී භාෂණ පරිවර්තන කටයුතු

ඇ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 ට අනුව සිදු කෙරේ.

MA 3 - 2025- රු.53,940-10x800-11x1190-10x1320 - 5x1350 – 94,980.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඇ. **වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 08. සංවර්ධන නිලධාරී - MA 3 - තනතුරු 20

අ. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාවේදී හෝ වාණිජවේදී හෝ ව්‍යාපාර කළමනාකරණය හෝ භූගෝල විද්‍යාව සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම

ආ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. සංවර්ධන ව්‍යාපෘති සඳහා වු පර්යේෂණ දත්ත රැස් කිරීම, සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම
ii. සංවර්ධන යෝජනා ක්‍රම ඇගයීම් සඳහා සහය වීම
iii. වීඩියෝ දර්ශන සඳහා තිර පිටපත්ද සකස් කිරීම සහ ප්‍රජා දැනුවත් කිරීම් සඳහා පිටපත් ලිවීම
iv. මානව සම්පත් ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම
v. පරිපාලන සහ මූල්‍ය ක්‍රියාදාමයන් පවත්වාගෙන යෑම සඳහා සහාය වීම
vi. ප්‍රජා දැනුවත් කිරීම්, ආපදා පෙර සූදානම් සහ හදිසි ප්‍රතිචාර දැක්වීම සඳහා සහාය වීම

ඇ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 ට අනුව සිදු කෙරේ.

MA 3 - 2025- රු.53,940-10x800-11x1190-10x1,320 - 05x1350 – 94,980.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඇ. **වයස :**

අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 09. සන්නිවේදන කාර්මික ශිල්පී - MA 2-1 - තනතුරු 01

අ. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් සන්නිවේදන කාර්මික ශිල්පී තනතුරට අදාළ වන විෂය ක්ෂේත්‍රයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

ආ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

**i.** පූර්ව දැනුම් දීමේ කුළුණු පද්ධතිය හා ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය ඇතුළු ඒ හා සම්බන්ධ අනිකුත් උපකරණ සම්බන්ධ සේවා හා නඩත්තු කටයුතු.

**ii.** ද්විත්ව මාර්ගික ජංගම දුරකථන, ස්ථාවර හා ජංගම ගුවන්විදුලි උපකරණ, ඇන්ටෙනා, පුනරාවර්තක, වීඩියෝ කැමරා හා අනිකුත් උපකරණයන් සවිකිරීම, ආරක්ෂාව හා ඒවා සම්බන්ධ කිරීම හා පරීක්ෂාව.

**iii.** අත් ආයුධ හා බවුතය භාවිතයෙන් ක්‍රියාවිරහිත කොටස් ඉවත් කර නිවැරදි කොටස් යොදා සැකසීම. විදුලි රැහැන් ඇදීම හා නිවැරදි යාන්ත්‍රික කොටස් සවිකිරීම.

**iv.** දෝලනේක්ෂය, සංඥා ජනකය, ඇමීටරය, වෝල්ට් මීටරය හා අනිකුත්විශේෂිත අත් ආයුධ මිනුම් හා පරීක්ෂණ උපකරණ භාවිතයෙන් විද්‍යුත් උපකරණ පරීක්ෂාව.

**v.** අවශ්‍යතාවය මත විද්‍යුත් සන්නිවේදන පද්ධතීන්ගේ ක්‍රියාකාරීත්වය උපකරණවල ක්‍රියාකාරීත්වය හා එම උපකරණයන්ට අදාලව නිවැරදි තෙරතුරු පවත්වාගෙන යාම.

**vi.** පිළියවනය (Relay), විදුලි යතුරු(switches), දඟර(coils), දර්ශක පහන්(Indicator lamp),ශබ්ද විකාශන යන්ත්‍ර, ස්වයංකීය පහන් ආදී උපකරණ වල ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම.

**vii.** ඉතා සූක්ෂම හා නිරවද්‍ය යාන්ත්‍රික ආයුධ අවශ්‍ය නොවන අවස්ථාවල ක්‍රියාවිරහිත කොටස් සඳහා ආදේශක යෙදීම හා ඒවා ගලපා සැකසීම.

**viii.** නැංවුම, උපකරණ, යතුරු, Relays , හා මානක පිරිසිදු කිරීම, තද කිරීම හා ඒවායේ සම්බන්ධතාවයන් සැකසීම.

**ix.** තනතුරට අදාළව කළමනාකාරිත්වය පවරනු ලබන අනෙකුත් කාර්යයන්.

ඇ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 ට අනුව සිදු කෙරේ.

MA2-1 - 2025- රු.50,540-10x540-07x630-04x890 - 20x1190 – 87,710.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඈ. **වයස :**

අවුරුදු18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 10. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) – MA 1-1 - තනතුරු 44

**අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

i. සිංහල/ දෙමළ
ii. ගණිතය

සහ

iii. තව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

iv. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විෂයයන් තුනකින් ( සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර ) සමත්ව තිබීම

ආ. **අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම - සුදුසුකම්**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පහත සඳහන් නියමයන්ට යටත්ව ආයතනයේ ප්‍රාථමික ශ්‍රේණියන්හි සේවකයන් සඳහා පවත්වනු ලැබේ. පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

**සුදුසුකම්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ‘‘ආ, ‘‘ඇ සහ ‘‘ඉ සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කල හැකිය.

(ආ) අ.පො.ස. (සා.පෙළ) විභාගය පළමු භාෂාව හා ගණිතය යන විෂයයන් දෙකට හා තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන්06 ක් සමත් වී තිබිම.
(පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ ෙවනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් ලබා තිබීම අතිරේක සුදුසුකමක් සේ සලකනු ලැබේ. )

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

සටහන (I) යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත "ඉ" ඡේදය සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

(II) යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත "ඉ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

ඈ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ආයතනයේ විවිධ අංශවල ලිපි ගොනු පවත්වාගෙන යාම හා භාරයේ තබා ගැනීම
ii. සියළුම ලිපි කටයුතු පරිගණක සහය ඇතිව ඉටු කිරීම
iii. ආයතනයේ සියළුම මිලදී ගැනීම් වලදී කළමනාකාරිත්වයේ නියෝග අනුව කටයුතු කිරීම
iv. ආයතනය සතු සියළුම වාහන නඩත්තුව පවත්වාගෙන යාමට අදාළ රාජකාරි
v. ආයතනයේ ගබඩා භාණ්ඩ භාරයේ තබා ගැනීම හා ඊට අදාළ කටයුතු.
vi. ආයතනයේ පවත්නා ගිණුම් මුලධර්ම අනුව ගිණුම් කටයුතු පවත්වා ගෙන යාම හා ඊට අදාළ රාජකාරි.
vii. ආයතනයේ සියළුම ගනුදෙනු විගණනයේදී විගණන නිලධාරිට සහය වීම හා වත්කම් ආරක්ෂාව හා අනිකුත් සම්බන්ධ රාජකාරි.
viii. ආයතනය හා බාහිර පුද්ගලයන් අතර සන්නිවේදන සබදතා පැවැත්වීම, දුරකථන හුවමාරු, අමුත්තන් පිළිගැනීම ආදී මහජන සම්බන්ධතා වලට අදාළ කටයුතු.
ix. මුලික ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ලෙජර් ගිණුම් පවත්වාගෙන යාම ගනුදෙනු සටහන් කිරීම හා අවසාන ගිණුම් පිළියෙළ කිරීමට සහය වීම.
x. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ ක්‍රියාත්මක වන ජාතික ඇමතුම් මධ්‍යස්ථානයේ දුරකථන සන්නිවේදන කටයුතු.
xi. සහකාර අධ්‍යක්ෂ හා එක්ව දිස්ත්‍රික්කය තුළ ඇති විය හැකි ආපදාවන් හඳුනා ගැනීම, එවැනි ආපදාවන් සඳහා අවදානම් ඇති ප්‍රදේශ හඳුනා ගැනීම සහ සිතියම් ගත කිරීම, ආරක්ෂිත ස්ථාන සහ ඒ සඳහා ගමන් මාර්ග හඳුනා ගැනීම සහ සිතියම් ගත කිරීම.
xii. ආපදා අවදානම් ඇති ප්‍රෙද්ශයන්හි ආපදා අවම කිරීමේ ව්‍යාපෘතීන් හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ කටයුතු.
xiii. දිස්ත්‍රික්කය තුළ ඇති විය හැකි ආපදාවන් පිළිබඳව ආපදාවන්ට ගොදුරු විය හැකි ප්‍රජාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් දීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම.
xiv. ආපදා අවස්ථාවන් ඇති වූ විටදී ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම. දිස්ත්‍රික් , ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරි මට්ටමින් ආපදා කළමනාකරණ කමිටු සහ අනුකමිටු පිහිටුවීම තුළින් ආපදා අවස්ථාවන්හිදී ප්‍රතිචාර දැක්වීමේ, පෙර සූදානම් සැලසුම් පිළියෙළ කිරීම.
xv. හදිසි අවස්ථාවන්හිදී ප්‍රතිචාර දැක්වීමේ කටයුතු සිදු කිරීම සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
xvi. ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් පළාත් පාලන මට්ටමින් දිස්ත්‍රික්, ප්‍රාදේශීය, ග්‍රාම නිලධාරි මට්ටමින් දැනුවත් කිරීම්, පුහුණු කටයුතු සම්බන්ධීකරණය.
xvii. ආපදා අවදානම වැඩි ප්‍රදේශයන්හි ජීවත් වන ප්‍රජාව සඳහා පෙරහුරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
xviii. හදිසි ආපදා අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගත හැකි භෞතික සහ මානව සම්පත් පිළිබඳව දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
xix. දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකකයේ මුල්‍ය පාලනය සම්බන්ධ කටයුතු
xx. ව්‍යාපෘති වාර්තා සැකසීම සඳහා සහය වීම
xxi. සහන සේවා කටයුතු වලට සහය වීම
xxii. දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
xxiii. ප්‍රවාහන කටයුතු.
xxiv. දිස්ත්‍රික් සංවර්ධන කමිටු වලට සහභාගී වීම

**ඇ. වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 ට අනුව සිදු කෙරේ.

MA1-1 - 2025- රු.46,220-10x540-07x630-04x890 - 20x1190 – 83,390.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

**ඉ. වයස :**

අවුරුදු18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 11. රියදුරු - PL 3 - තනතුරු 05

**අ. බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් (02) වත් සමත් වී තිබිය යුතුය.

**ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් තිබිය යුතුය.

**ආ. තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ආරක්ෂිතව රිය පැදවීම.
ii. වාහනයේ නඩත්තු කටයුතු .
iii. ධාවන සටහන් පවත්වාගෙන යාම.
iv. අනතුරකදී විධිමත් ලෙස අදාල බලධාරීන්ට දැන්වීම .
v. තමන් වෙත භාර දී ඇති රාජ්‍ය දේපල පිළිබඳ පූර්ණ ආරක්ෂාව සැලසීම.

**ඇ. වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 ට අනුව සිදු කෙරේ.

PL 3 - 2025- රු.43,280-10x5490-10x540-10x590 - 12x630 – 67,040.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඇ. **වයස :**

අවුරුදු18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 12. කාර්යාල සහායක - PL1 - තනතුරු 04

අ. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය.

අදාල වන පරිදි මෝටර් සයිකල් පැදවීම සඳහා බලපත්‍රය තිබිය යුතුය.

ආ. **තනතුරට පැවරෙන කාර්යයන් :**

i. ලේඛණභාරව කටයුතු කිරීම
ii. පොත් බැඳීම
iii. අනුපිටපත් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියා කරවීම
iv. බයිසිකල් මගින් පණිවුඩ ගෙනයාම
v. කාර්යාලයේ ලිපි බෙදා හැරීම
vi. සෝපාන යන්ත්‍ර ක්‍රියාකරවීම
vii. පණිවුඩ ගෙනයාම
viii. කාර්යාල මුර කිරීම
ix. කාර්යාල ඇමදීම
x. උද්‍යාන වැඩ
xi. සනීපාරක්ෂක වැඩ සහ කාර්යාල කම්කරු රාජකාරී

ඇ. **වැටුප් ක්‍රමය :**

තනතුරට අදාළ වැටුප් ගෙවීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 ට අනුව සිදු කෙරේ.

PL 1 - 2025- රු.40,500-10x450-10x490-07x540 - 15x590 – 62,530.00. ජීවන වියදම් දීමනාව හා කලින් කලට රජය විසින් ලබා දෙනු ලබන වෙනත් දීමනාද ලබා දෙනු ලැබේ.

ඈ. **වයස :**

අවුරුදු18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙහි සඳහන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 13. පත්වීමේ ස්වභාවය :

අ. ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවාදායකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

ආ. බාහිර අයදුම්රුවන් අතුරින් තෝරා පත් කර ගනු ලැබුවහොත්, එම අය වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

ඇ. අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරින් තෝරා පත් කර ගනු ලැබුවහොත්, එම අය එක් අවුරුදු වැඩබැලීමේ කාල සීමාවකට යටත්ව පත් කරනු ලැබේ.

## 14. වෙනත් අවශ්‍යතා :

**සෑම අයදුම්කරුවෙක්ම;**

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ආ. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම අවශ්‍යතාවය අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
ඇ. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

## 15. අයදුම්පත් එවිය යුතු ආකාරය :

අයදුම්පත www.dmc.gov.lk වෙබ් අඩවියේ පළ කොට ඇති අතර ඒ අනුව සකස් කර ගත් අයදුම්පත් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2026.01.11 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අංක 120/2, විද්‍යා මාවත, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. අයදුම්කරු විසින් තම අයදුම් පත්‍රයේ "බාහිර අයදුම්කරුවෙකු" ද , "අභ්‍යන්තර අයදුම්කරුවෙකු" ද යන්න පැහැදිලිව සඳහන් කල යුතු අතර, අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, " අයදුම් කරන තනතුර" පැහැදිලිව ලියා දැක්විය යුතු වේ.

අයදුම්පත්‍රය සමඟ අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක්, ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, සහ තමා සතු සියළුම අධ්‍යාපන සහතික, වෘත්තීය සහතික, සේවා සහතික යන සහතිකයන්හි පිටපත් එවීම **අනිවාර්යය වේ.** තැපැලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වග කියනු නොලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, හෝ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු වූවන් සිය අයදුම්පත්‍රය ආයතනයේ ප්‍රධානියා මඟින් එවිය යුතු අතර එසේ නොඑවන සහ **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පසුව මෙම මධ්‍යස්ථානය වෙතට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සැලකිය යුතුයි:**

මෙම දැන්වීම www.dmc.gov.lk යන වෙබ් අඩවියේ පලකොට ඇත.

අධ්‍යක්ෂ ජනරාල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
අංක 120/2
විද්‍යා මාවත
කොළඹ 07